*Vidyodaya J. Soc. Sc., Vol. 7 1 & 2 1996, pp. 1-12.*

# මහාචාර්ය මැන්දිස් රෝහණදීර හා ඔහුගේ ශාස්ත්‍ර සේවාව

*ඩී. ඇල්. අබේවර්ධන*

"**හෙට ඇවිත් පත්වීමේ ලිපිය බාර ගන්න. ලබන සතියේ දේශන වලට එන්න**" දකුණු පළාතේ මහාවිද්‍යාලයක විදුහල්පති තනතුරක් බාරගැනීම සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයට පා නගන රෝහණදීර මහතාට එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ අංශාධිපති ගෞරවාර්හ හාන්දුපැල්පොල පුඤ්ඤරතන නාහිමි වෙනත් කටයුත්තක් සඳහා එම අමාත්‍යාංශය අබියස මුණගැසී සරස්වතියට දොර විවෘත වී ඇති බවට ඉඟියක් කළේ මීට වසර තිස් පහකට පෙර ය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ (එවකට විද්‍යෝදය විශ්වවිද්‍යාලය) වසර තිස් පහකට අධික කාලයක් සේවාවේ නියළුණු මහාචාර්ය රෝහණදීර මුළු මහත් විශ්ව විද්‍යාලයටත්, උසස් අධ්‍යයන ක්ෂෙත්‍රයටත් දහස් සංඛ්‍යාත ශිෂ්‍ය පරපුරේ අනාගත අභිවෘධියටත් මේ කාල පරිච්ඡේදය තුළ කරන ලද අනුපම සේවාව අමරණීය ය. මෙ රට ජාතික සංස්කෘතිය ආරක්ෂා කර ගනිමින් සියවසකට වඩා අධ්‍යාපනයට උරදුන් විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් 1959 වර්ෂයේ ජාතික විශ්වවිද්‍යාල බවට පත්වීම අධ්‍යාපන ඉතිහාසයේ විශිෂ්ඨතම සිද්ධියක් ලෙස පිළිගැනේ. එබඳු ප්‍රෞඪ ජාතික ආයතනයක් තුළින් ම මහාචාර්ය රෝහණදීරගේ අනුපම සේවාම ඉටුවීම ඒ අකාරයෙන් ම වැදගත් ය. බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයේ මෙරට දේශීය අධ්‍යාපන ආයතන විවිධ බාධක මධ්‍යයේ ඉදිරියට යමින් අභිමානවත් සේවාවක් ලබා දුන්නාක් මෙන් ම මහාචාර්ය රෝහණදීර, තමාට කුඩා අවදියේ සිට ම මුහුණ දීමට සිදුවූ අභියෝග ජය ගනිමින් ජීවන මඟෙහි ඉහළම හිණිපෙත්තට නැඟ එවන් ජාතික ආයතනයක් තුළින් තම සේවාව ඉටු කිරීමට සමත් විය.

1931 දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ පල්ලත්තර නම් ග්‍රාමයේ ජන්ම ලාභය ලත් මැන්දිස් රෝහණදීර මූලික අධ්‍යාපනය එම ගමේ රජයේ සිංහල මිශ්‍ර පාසලෙන් ඇරඹීය. එම පාසැලෙන් අධ්‍යාපනය ඇරඹූ මැන්දිස් රෝහණදීර අධ්‍යාපනය හමාර කළේ සිංහල ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ප්‍රථම පංතියේ සමාර්ථයක් ද ලබාගනිමින් තම හපන්කම හා දක්ෂතා එළිදක්වමින් මෙන් ම තමාගේ ගමට ද , ගමේ පාසැලට ද කීර්තියක් අත්කර දෙමිනි. සිංහල ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වීමේ සුදුසුකම උසස් අධ්‍යාපනය ලබාගැනීමට හෝ රජයේ පිළිගත් රැකියාවකට පිවිසීමට එකල සුදුසුකමක් නොවීය. එයට හේතුව උසස් අධ්‍යාපනය හා රජයේ ලිපිකරු සේවාව ඉංග්‍රීසි මාධ්‍යයෙන් සිදුවීමයි.

මේ වකවානුවේ සිංහල ජ්‍යෙෂ්ඨ විභාගයෙන් සමත් වුවකුට යා හැකි මග සීමා වූ අතර සිංහල නොතාරිස් කෙනකු වීම හෝ ගම්බද පාසැලක සිංහල ගුරුවරයකුවීම පමණි, ප්‍රවිෂ්ඨවීමට තිබූ මාර්ග වූයේ. මෙවැනි

පසුබිමක දක්ෂකම් ඇති උසස් අනාගතයක් සිහිකරන සිසුවකුට එකල මහත් පෞරුෂයක් ලෙස දැකිය හැකි වූයේ පාසැලට පැමිණෙන පාඨශාලා පරීක්ෂකවරයා ය. පාසැල් පරීක්ෂකවරයා වසරකට වරක් පාසැලට පැමිණීම ඉතා වැදගත් දවසක් වූ අතර එදින පරීක්ෂකවරයා පාසැල තුළට ප්‍රවේශ වන විට ප්‍රධානාචාර්ය වරයාගේ නළා හඬින් ගුරු මණ්ඩලයත් ශිෂ්‍ය ශිෂ්‍යාවනුත් එක්වර නැගිට ඔහුට "ආයුබෝවන්" කියා ආචාර කිරීම සිරිතකි. එසේම ඉතා තේජාන්විතව ප්‍රධානාචාර්යවරයාගේ ආසනයේ ඉඳ ගත් පසු දෙවන නළා හඬින් ආචාර්ය මණ්ඩලය හා ශිෂ්‍ය ශිෂ්‍යාවෝත් හිඳ ගනිති. මෙම පාඨශාලා පරීක්ෂකවරයා, ගුරු - ශිෂ්‍ය දෙපිරිස අරා වැජඹෙන මහා පුරුෂයකු ලෙසට පෙනීගිය හෙයින් පාසැල් අවධියේ සිටම එවන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා පරීක්ෂකවරයකු වීම රෝහණදීරගේ අනාගත පැතුම විය. එම බලාපොරොත්තුව ඇතිව මැන්දිස් රෝහණදීර 1949 වසරේ දී ගුරු අභ්‍යාස විද්‍යාලයේ ප්‍රවේශ පරීක්ෂණයකට පෙනී සිට ඉන් සමත් ව 1950 - 1951 වසරවල නිට්ටඹුව ගුරු අභ්‍යාස විද්‍යාලයහි පුහුණුව ලැබීය. එම කාලය තුළ ගුරු අභ්‍යාස විදුහලේ පුහුණුව ලැබූ අය අතුරින් ළාබාලම අභ්‍යාසලාභියාවූයේද මැන්දිස් රෝහණදීරය. ඔහු සමඟ එකට පුහුණුව ලද ගුරු මහතුන් සියලු දෙනාම පාහේ අද විශ්‍රාමිකයෝය. නො එසේනම් මහගමසේකර මෙන් මෙලොව හැර ගොස් ය.

නිට්ටඹුව ගුරු අභ්‍යාස විද්‍යාලය මුනිදාස කුමාරතුංග, රැයිපියල් තෙන්නකෝන් වැනි පඬිවරුන් වැජඹුණු විද්‍යාස්ථානයක් විය. එයට පිවිසෙන නවකයින්ට සිංහල භාෂාව, සාහිත්‍යය පිළිබඳ අමුතු උද්යෝගයක් නිසගීයෙන් ඇති වූයේ එහෙයිනි. සිංහල විෂය භාරව සිටියේ චිරාගත සිංහල ගුරු පරපුරේ යෝධයකු බඳු ප්‍රාංශු දේහධාරී දො.පෙ. අතුකෝරළ ගුරුතුමාණෝ ය. එතුමාගේ මාර්ග දේශකත්වය යටතේ එම වසර දෙක තුළ සියබස්ලකර, කව්සිළුමිණ, සසදාවත මුවදෙව්දාවත, ගුත්තිලය, කාව්‍යසේකරය, සැළලිහිණි, ගිරා, කොවුල්, හංස සන්දේශ යනාදී පුරාතන පද්‍ය සාහිත්‍යය ද අමාවතුර, ධම්ප්‍රදීපිකාව, බුත්සරණ, සද්ධර්මාලංකාරය, උම්මග්ග ජාතකය, ආදී පුරාතන ගද්‍ය සාහිත්‍යය ද, සිදත් සඟරාව, මුනිදාස කුමාරතුංගයන්ගේ ව්‍යාකරණ විවරණය හා ක්‍රියා විවරණය වැනි ව්‍යාකරණ ග්‍රන්ථද පිළිබඳ පෘථුල භාෂා සාහිත්‍ය ඥානයක් ලබා ගැනීමේ වාසනාව එදා එම අභ්‍යාස විදුහලෙන් හිමි විය. රෝහණදීර මහතාගේ ගුරු අභ්‍යාස විදුහල් ජීවිතයේ තවත් වැදගත් සිද්ධියක් වූයේ 1951 සැප්තැම්බර් මස දිනයක එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා මුණ ගැසීමයි. නිට්ටඹුව ගුරු අභ්‍යාස විදුහලේ ආචාර්ය අතුකෝරළ මහතා, බණ්ඩාරනායක මහතා ළඟින් ඇසුරු කළ කෙනෙකි. අතුකෝරළ මහතා සිංහල රාජ්‍ය භාෂාව කිරීම, ආයුර්වේදයට නිසි තැන ලබාදීම, යනාදී සිංහල මහාසභාවේ වැදගත් යෝජනා සකස් කොට ඒවා මාදම්පේ සම්මේලනයේ දී සම්මත කොට ගෙන ඒවා පිළිබඳව එවකට අග්‍රාමාත්‍ය ඩී. එස්. සේනානායක මහතා සමඟ අවසන් වටයේ සාකච්ඡාවලට ද සහභාගි වූ කෙනෙකි.

1951 එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා තම බලාපොරොත්තු අසාර්ථක වීමෙන් පසු එක්සත් ජාතික පක්ෂයෙන් හා අමාත්‍යධුරයෙන් ඉල්ලා අස්වීමේ පුවත මෙරට දේශපාලන ඉතිහාසයේ මහත් ආන්දෝලනයක් ඇති කළ සිද්ධියකි. එය සියළුම පුවත් පත් වල ප්‍රධාන ශීර්ෂ පාඨය ද විය. මේ දිනවල බණ්ඩාරනායක මහතා තම හොරගොල්ල වළව්වේ කල් ගෙවමින් අළුත් දේශපාලන සංවිධානයක් සැලසුම් කරමින් සිටියේය. අතුකෝරළ මහතා තම ගුරු විදුහලේ සිසුන් කීපදෙනෙකු සමඟ බණ්ඩාරනායක මහතා හමුවීමට අදහස් කළේය. "බණ්ඩාරනායක මහතා හමුවීමට කැමැති ද? යනුවෙන් සිසුන්ගෙන් විමසූ විට "අපි කැමතියි" රෝහණදීර ඉදිරිපත් වෙමින් කියා සිටියේ ය. එක් සන්ධ්‍යා සමයක මැන්දිස් රෝහණදීර, මහගමසේකර ඇතුළු ශිෂ්‍යයින් හතර දෙනකු කැටුව අතුකෝරළ මහතා හොරගොල්ල වළව්වට ගොස් පිටුපස ආලින්දයේ හාන්සි පුටුවක දිගාවී පයිප්පයක් උරමින් කල්පනාවේ නිමග්න වී සිටි කෙසඟ බණ්ඩාරනායක මහතා බැහැ දුටුවෝය. අතුකෝරළ මහතා සහ සිසුන් දුටු බණ්ඩාරනායක මහතා මහ හඬින් සිනා සී" එන්න, එන්න, ඉඳගන්න" යයි ආරාධනා කළ අතර අතුකෝරළ මහතා තම තරුණ සිසුන් හඳුන්වා දුන්නේ ය. "මේ අය නිට්ටඹුවේ පුහුණු වන ගුරුවරු. බොහොම ඈත ප්‍රත්‍යන්ත ප්‍රදේශවලින් ආ අය " යනුවෙන් ප්‍රකාශ කර සිටියේය.

බණ්ඩාරනායක මහතා තමා නව දේශපාලන පක්ෂයක් ගොඩ නගන බවත්, සඟ, වෙද, ගුරු, ගොවි, කම්කරු යන පංච මහා බලවේග එම පක්ෂය වටා රොක් විය යුතු බවත් ප්‍රකාශ කළේය. බණ්ඩාරනායක මහතා සමඟ සතුටු සාමීචියෙන් කල්ගෙවා සමුගන්නට යත්ම අතුකෝරළ ගුරුතුමා රෝහණදීර පෙන්වා "රුහුණේ හම්බන්තොට තරුණයෙක්." යනුවෙන් බණ්ඩාරනායක මහතාට හඳුන්වා දෙනවාත් සමඟ ආ............ හම්බන්තොට, ඩී. ඒ. ගේ ආසනයේ තරුණයෙක් නෙ" යනුවෙන් බණ්ඩාරනායක මහතා රෝහණදීර මහතාගේ පිටව තට්ටු කොට" බොහොම හොඳයි, ඩී. ඒ. මගේ හෙවණැල්ල වගේ, මං පස්සේ ආපු කෙනෙක්, එයත් එක්ක එකතු වෙලා මගේ පක්ෂයට වැඩ කරන්න. "යැයි ගැඹුරු හඬින් පැවැසීය. බණ්ඩාරනායක මහතාගේ එම ගැඹුරු හඬ" තම හදවත තුළ කිඳා බැස අද දක්වා දෝංකාර දෙන්නේයයි" රෝහණදීර මහතා අද පවා වරින් වර සිහි කරයි.

නිට්ටඹුව ගුරු අභ්‍යාස විද්‍යාලයේ දැවුරුදු පුහුණුවෙන් පසු පරම විඥාණාර්ථ බෞද්ධ සමාගමේ, කළුබෝවිල බුද්ධඝෝෂ විද්‍යාලයට පත්වීමක් 1952 ජනවාරි මස ලබාගත් මැන්දිස් රෝහණදීර එම පාසැලේ ඉහළම පන්තිවල එනම් ජ්‍යෙෂ්ඨ පන්තිවල සාහිත්‍ය විෂය භාර ගුරුවරයා විය. කොතරම් ජනප්‍රිය සාහිත්‍ය ගුරුවරයකු වී ද යත්, එම පන්තිවල හැම සිසුවකුම පාසැලට ඒම මහ නොහැරියේ රෝහණදීර මහතාගේ සාහිත්‍ය පාඩමට සවන් දීමට තිබූ ඕනෑකම නිසායයි. අදත් ඔවුහු භක්ති ප්‍රණාමයෙන් යුතුව සිහිපත් කරති.

අගනුවරට ආසන්න විදුහලක ගුරු වෘත්තියෙහි යෙදුණු රෝහණදීර මහතාට ඉංග්‍රීසි ඥානය දියුණු කර ගැනීමේ කුහුලක් ඇති විය. කොහුවල වින්ඩ්සර් කොලීජියේ රාත්‍රි ඉංග්‍රීසි පාඨශාලාවට ගිය රෝහණදීර මහතා එම විද්‍යාලයේ රාත්‍රී පන්තිවලට දිනපතා සහභාගි වී 1953 ඉංග්‍රීසි ජ්‍යෙෂ්ඨ විභාගයට පෞද්ගලික අපේක්ෂකයකු ලෙස පෙනී සිට සමත් විය. ඉක්බිති පෞද්ගලික පන්තිවලට සහභාගිවෙමින් 1955 වසරේ විශ්වවිද්‍යාල ප්‍රවේශ පරීක්ෂණයට ද පෙනී සිට ඉන්ද සමත් විය.

ඉන්පසු පේරාදෙණිය විශ්වවිද්‍යාලයට පිවිසුණු රෝහණදීර මහතා එම විශ්වවිද්‍යාලයේ ගත කළ කාලය තුළ ශාස්ත්‍රීය ජීවිතයේ ගැඹුරු අඩිතාලමක් දමා ගැනීමට ක්‍රියාකාරී විය. සිංහල සාහිත්‍යය, නාට්‍ය කලාව යනාදිය පිළිබඳව ඔහුගේ කුහුල හා දැනුම පිබිදුණේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේදීය. සාහිත්‍යය, කලාව හා ඉතිහාසය යන විෂයයන් විචාරාත්මකව හැදෑරීමේ හා පුළුල් ලෙස විමසා බැලීමේ ශික්ෂණය ලද්දේ මේ සමයේදීය. මහාචාර්ය ඩී.ඊ. හෙට්ටිආරච්චි, මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර, එච්. සී. රායි ආදී පඬිවරු දිසාපාමොක් ඇදුරන් මෙන් තම ඥානසම්භාරය දියුණු කර ගැනීමට උපකාර වූ ආකාරය ඔහු අදත් සිහිපත් කරන්නේ ඉතා ගෞරවයෙනි.

පේරාදෙණිය සරසවියේ අධ්‍යාපනයෙන් පසු යළිත් 1958 වසරෙහි තම පුරුදු ගුරු වෘත්තියට පිවිසි රෝහණදීර වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලයේ සේවය සඳහා ගියේය. 1945 වසරේ සිට ඇරඹුණු නිදහස් අධ්‍යාපන පනත ක්‍රියාත්මක වීමේ ක්‍රියා පටිපාටියේදී ඉංග්‍රීසි පාසල්වල අධ්‍යාපන මාධ්‍යය වසරින් වසර පන්තියෙන් පන්තියට ස්වභාෂා මාධ්‍යයට ළඟාවීමේ ක්‍රියාවලිය 1959 වන විට විශ්වවිද්‍යාල ප්‍රවේශයට පිවිසෙන පන්තිය දක්වා කුළුගැන්වී තිබිණි. ඉංග්‍රීසි පාසැල් ගණයේ ලා සැළකුණු වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලයේදී පළමුවරට ස්වභාෂා මාධ්‍යයෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශයට සැරසෙන පළමු ශිෂ්‍ය කණ්ඩායමට සාහිත්‍යය හා ඉතිහාසය යන විෂයන් ඉගැන්වීමේ භාග්‍ය ලැබුණේ මැන්දිස් රෝහණදීර මහතාටය. ඈත පිටිසර නොදියුණු පාසල්වල මවු බසින් අධ්‍යාපනය හදාරා 1959 විශ්වවිද්‍යාල දොරටුව වෙත පැමිණි පළමු ශිෂ්‍ය කණ්ඩායම නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස විරුදාවලියෙන් පුදනු ලැබූ, මෙරට ජනතාවගේ ආදර බහුමානයට පාත්‍ර වූ ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතාගේ සුජාත කුළුදුල් දරු පරපුර ලෙස රෝහණදීර මහතා නිතර හඳුන්වයි.

වීරකැටිය මධ්‍ය මහා විද්‍යාලය ජීවිතය තවත් පැත්තක් මහාචාර්ය මැන්දිස් රෝහණදීරගේ ජීවිතය සලකුණු කලේ තම ගෘහ ජීවිතයේ සෙවණැල්ලක් බඳුව නොවෙනස්ව එක් ව හැමවිටම කටයුතු කරන සහකාරිය වූ පදුමා වීරවර්ණකුල මෙනවිය පළමුවරට හමුවීමයි.

විශ්වවිද්‍යාල ප්‍රවේශ පන්තිවල ආචාර්යවරයා ලෙස කටයුතු කරන කාලයේදී මහාචාර්ය මැන්දිස් රෝහණදීර, විශ්වවිද්‍යාල අවසාන පරීක්‍ෂණයට ඉදිරිපත් කරන ලද ඇන්ටන් චෙකොව්ගේ චෙරිවත්ත සරච්චන්ද්‍රයන්ගේ විශ්ව නාට්‍ය පුස්තකමාලා යටතේ මුද්‍රණය කිරීමට නිර්දේශ කරනු ලැබ සති අන්තවලදී පේරාදෙණියේ දී මහාචාර්ය සරච්චන්ද්‍ර මුණ ගැසී අවශ්‍ය සංශෝධන සිදු කිරීමට තියළෙන්නට තරම් ක්‍රියාශීලි විය. මේ ධෛර්‍යසම්පන්න ක්‍රියාවලිය ඔහුගේ සිත්හි බැඳුණේ තමා ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ සාහිත්‍ය හා නාට්‍ය නිර්මාණ කුසලතා වැඩි දියුණු කරනු අරමුණ ද පෙරදැරිව තිබු හෙයිනි. ඊට අමතරව නාට්‍ය නිෂ්පාදන හා සාහිත්‍ය නිර්මාණ කෙරෙහි සිසුන් දිරිමත් කිරීමේ ක්‍රීඩා කාරීව නියළි සිටියේය.

මෙවන් අවධියක දේශපාලන හේතුන් මත 1959 අගභාගයේ ඌව පළාතේ වැලිමඩ ප්‍රදේශයේ මැදවෙල මහා වියාලයට මැන්දිස් රෝහණදීර මාරු කරනු ලැබීය. මැදවල මහා විද්‍යාලයේ තම සුපුරුදු කාර්යයන්හි නිරත වූ හෙතෙම තම පන්තියේ සිසු දරුවන්ගේ නාට්‍ය, සාහිත්‍ය, ඉතිහාසය පිළිබඳ රුචිය දියුණු කරන්නට විවිධ නිර්මාණශිලි ක්‍රියා මාර්ගයන් අතර 1960 වසරේ එම විදුහලේ සිසු දරුවන් යොදවා මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ "රත්තරන්" නාට්‍ය වේදිකා ගත කළේය.

ඒ අනිවාර්යයෙන්ම තම අධ්‍යාපනය ද ඉදිරියට ගෙන යාමට ධෛර්‍ය සම්පන්න වූ මැන්දිස් රෝහණදීර ලන්ඩන් විශ්වවිද්‍යාලයේ බී. ඒ. ගෞරව උපාධියට ද සුදානම් විය. මෙම කටයුත්ත සාර්ථක ලෙස ඉටු කර ගැනීමට මැදවල වැනි ස්ථානයක සිට දුෂ්කර විය. අවබෝධ කර ගත් හෙතෙම පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ තමා සමඟ අධ්‍යාපනය ලත් සහයකුගේ සහාය ඇතිව අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් වරයා හමු වී අවශ්‍යතාවය පැහැදිළි කොට 1960 ඔක්තෝම්බර් මස වැල්ලම්පිටියේ සේදවත්ත මහා විද්‍යාලයට මාරුවක් ලබා ගෙන පැමිණියේය. කොළඹට පැමිණ නාලන්ද විද්‍යාලයට කිට්ටුව සිරිධම්ම මාවතේ නවාතැනක තම ගුරු අභ්‍යාස විද්‍යාලයේ පැරණි මිතුරන් දෙදෙනකු වූ මහගමසේකර හා ඩී. ඒ. කුමාරගේ ඇතුළු සිද්ධිවිහාරිකයින් කීපදෙනකු සමඟ ගෙවූ කාලය මැන්දිස් රෝහණදීරගේ අතිශය කාර්ය බහුල වසරක් සේ ඔහු සිහිපත් කරයි.

රෝහණදීර තම අධ්‍යාපන කටයුතු වලට අමතරව ගුවන්විදුලි වැඩසටහන් හා නාට්‍යය රචනා කිරීම හා නීරික්ෂණය ආදී කටයුතු කෙරෙහි උනන්දුවක් දැක්වීය. 'මහගමසේකර' වැඩසටහන් සම්පාදකයෙකු ලෙස ගුවන්විදුලියේ සේවය කළ අතර පණ්ඩිත ඩබ්. ඩී. අමරදේවයන් 'මධුවන්ති' නම් ජනප්‍රිය සංගීත වැඩසටහන දියත් කළේද මේ කාලයේදීය. මහගමසේකර ගුවන්විදුලියට නිතර ගී ලියූ අතර ඒ සඳහා රෝහණදීර මහතාගේ විචාර අදහස් ලබාගැනිමට ගැනීමට අමතක නොකළේය. මේ කාලයේ ජී. බි. සේනානායක, සිරි ගුනසිංහ, ගුණදාස අමරසේකර ආදී

නිදහස් පද්‍යය, ජනකවි ආභාසිත පද්‍යය ආදිය උපයෝගි කොටගනිමින් සිංහල කවියේ පර්යේෂණශීලී නවයුගයක් අරඹා තිබිණ. මහගමසේකරද මේ නිදහස් නිසඳැස් කවි විප්ලවය අත්හදා බලමින් සිටියේය.

මහාචාර්ය සරත්චන්ද්‍රයන් "සිංහබාහු" නාට්‍යය හැඩගසමින් සිටියේද මේ අවධියේය. රෝහණදීරයන් 'වෙරිවත්ත' නාට්‍යය පිටපත සංස්කරණය සඳහා මහාචාර්ය සරත්චන්ද්‍ර සමග පේරාදෙණිය මහකන්දේ සති අන්තයේ ගතකරන ලද දිනයන්හි සිංහබාහු පෙළගැසෙන අවස්ථාවල ඒවා නිරීක්ෂණය කරමින් නාට්‍ය කලාව වෙත වඩ වඩා නැඹුරු වෙමින් සිටියේය. සතියට දෙතුන් වරක් මාටින් වික්‍රමසිංහ හා සුහද සංවාදයේ යෙදෙමින් සාහිත්‍යය විචාරය වෙතට යොමු වෙමින් සහ අතර මාටින් වික්‍රමසිංහ, සරත්චන්ද්‍ර, සිරි ගුණසිංහ, කේ ජයතිලක මහගමසේකර ආදීන්ගේ නිර්මාණයන් හි ලෙන්ගතු සහෘදයකු බවට පත්විය. මෙවන් අවදියක එනම් 1960 අග තමා පෙනී සිටි පාලි හා සංස්කෘත පිළිබඳව ලන්ඩන් බී. ඒ. ගෞරව උපාධි පරීක්ෂණයෙන් ද විද්‍යොදය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රවේදී උපාධියෙන්ද සමත්විය. 1961 දෙසැම්බර් 1ද විද්‍යොදය විශ්වවිද්‍යාලයේ සහකාර කථිකාචාර්ය ධූරයට තේරී පත් වූ මැන්දිස් රෝහණදිර මාලිගාකන්දේ විද්‍යොදය පිරිවෙනේ කුඩා කුටියට ගොස් එහි වැඩසිටි විද්‍යෝදය විශ්ව විද්‍යාලයේ ප්‍රථම උපකුලපති පූජ්‍යපාද වැලිවිට ශ්‍රී සෝරත නායක හිමිපාණන් බැහැදැක සිටියේය. "ආ මේ මහත්තයද අලුතින් පත්වුණේ? "රෝහණදීර" යැයි සෙමෙන් නම කියා මොහොතක් ඔහු දෙස බලා සිටි උන්වහන්සේ තම ගම් ප්‍රදේශය ආදිය විමසා "මහත්තයා අපි ගත්තේ ලංකා ඉතිහාසයේ පැරණි යුගය ගැන ශිෂ්‍යයන්ට උගන්වන්න" "දීප වංශය, මහාවංශය වගේ පාලි පොත්වල ඉංග්‍රීසි පරිවර්තනවල හුඟක් වැරදි තියනව, මහත්තයා පාලි භාෂාවෙන්ම මූලාශ්‍ර, කියවලා ලංකා ඉතිහාසය තේරුම් අරගන උගන්වන්න මහන්සි ගන්න. ඒ වගේම ඉක්මනින් එම්. ඒ. උපාධියකුත් ගන්න." උන්වහන්සේගේ දෙපා නැමද පිටත් වූ රෝහණදීර, නායක ස්වාමීන්වහන්සේගේ වදන් අකුරට පිළිපදිමින් පාලි මූලාශ්‍රයන්ගෙන් එක එල්ලේ කරුනු ගනිමින් ලංකා ඉතිහාසය ඉගැන්වීමේ හා පර්යේෂණ කිරීමේ එකදිගට නියැලි සිටියේය. 1961 දී විද්‍යොදය විශ්වවිද්‍යාලය ගංගොඩවිල නව ගොඩනැගිලිවලට ගෙන ඒමෙන් පසු ඉඩකඩ සහිත පහසු ස්ථානයක මෙම උසස් ආයතනය ස්ථාපිත විය. ඉතිහාසය අධ්‍යයනාංශය විශ්වවිද්‍යාලය තුළ විශාලතම ශිෂ්‍ය සංඛ්‍යාවක් සිටි අධ්‍යයනාංශ දෙකතුනින් එකක් විය. ආරම්භක වකවානුවේ සිසුන්ගේ වැඩිවීම නිසා ආරම්භක වකවානුවේ ජ්‍යෙෂ්ඨ ආචාර්යවරුන් දෙතුන් දෙනෙකු හැරුණු විට තවත් බොහෝ දෙනෙක් බාහිර කථිකාචාර්ය වරුන් ලෙස විශ්වවිද්‍යාල සේවාවේ යෙදී සිටියහ. වර්තමාන මුදල් අමාත්‍යංශයේ ලේකම්

බී.සී.පෙරේරා, සිරිල් ගමගේ, පී.ඒ.ටී. ගුණසිංහ ආදී පරිපාලන සේවයේ නිලධාරින්හු ද බාහිර එම බාහිර කථිකාචාර්යවරුන් අතර වූහ. ආධුනික කථිකාචාර්යවරුන් කීපදෙනෙකු මේ වනවිටත් අධ්‍යයන අංශයට බඳවා ගෙන තිබුණු අතර මොවුන් ඉතිහාස විෂයට වඩාත් උනන්දු කරවීම රෝහණධීර යන්ගේ විශේෂ තවත් අභිලාෂයක් විය.

සතියේ ඇතැම් දිනවල සවස් භාගයේ තම කාමරයට කැඳවන ආධුනික කථිකාචාර්යවරුන් සමඟ ඉගැන්වීමේ කටයුතු, විෂය මාලා සැකසීම, පර්යේෂණ කටයුතු යනාදිය ගැන සාකච්ඡා කෙළේය. ඉන්පසු එක්වරම මොවුන් සියල්ලම තම රථයේ නංවාගෙන නුගේගොඩ රේමන්ඩ් පාරේ පිහිටි මහාචාර්ය පරණවිතාන මහතා සොයායාම සුපුරුදු චර්යාවක් බවට පත්වෙමින් තිබිණි. තම ගෝලයන් සමඟ මහාචාර්ය පරණවිතාණයන්ගෙන් ඉතිහාසය පිළිබඳ විචාරාත්මක අවබෝධයක් ආධුනික කථිකාචාර්යවරුන්ට ලබාදීම ඔහුගේ අපේක්ෂාව විය. පළමුව සංස්කෘත ශ්ලෝකයකින් හෝ සෙල්ලිපි පාඨයකින් පැහැදිළි කිරීම අරඹන මහාචාර්ය පරණවිතාන වංශ කථා ශිල්පීය සාධක ගෙන හැර දක්වමින් සිත් ගන්නා අයුරු තමාගේත් විමසනු ලැබූ දේ පහදා දීමට පරණවිතාන මහතා රුසියෙකි. මේ ආචාර්යවරයා තම සගයින් සමග බොහෝ සති අන්තවල් බුත්තල, මොණරාගල, කිරින්ද, මන්නාරම වැනි ඈත ප්‍රදේශවල ගම් දනවු සැරිසරමින් ඓතිහාසික ස්ථාන නරඹමින් සෙල්ලිපි නටබුන් ගැන තොරතුරු විමසමින් කළ අධ්‍යාපන සංචාර අද වැඩිහිටියන් බවට පත්වී සිටින එම කථිකාචාර්යවරුන් සිහි කරන්නේ ගෞරවයෙන් හා ආඩම්බරයෙනි. මෙහි ප්‍රතිඵලයක් ලෙස හෝ පර්යේෂණ කටයුතු ගැන ඉමහත් උනන්දුවක් දැක් වූ ඉතිහාස අධ්‍යනාංශයේ ආධුනික කථිකාචාර්යවරුන් පස් දෙනාම එකම වර්ෂයක් තුළ විදේශ විශ්වවිද්‍යාලවලට තේරී තම පශ්චාත් උපාධි කටයුතුවල නිරත වී එමරටවල දී සියලු දෙනාම පශ්චාත් උපාධි සාර්ථක ලෙස නිමවා නැවත අධ්‍යයනාංශයේ සේවයට පැමිණියහ. ගංගොඩවිල විශ්වවිද්‍යාලය ආරම්භයේදී විශාල ශිෂ්‍ය සංඛ්‍යාව සිටි ඉතිහාස අංශයේ මහාචාර්යවරයා වූ හේම එල්ලාවල මහතා ද ලන්ඩන් විශ්ව විද්‍යාලයේ පර්යේෂණ කටයුතුවල යෙදී සිටි අතර එවකට ජ්‍යෙෂ්ඨ ආචාර්යවරයා වූ හාන්දුපැල්පොල පුඤ්ඤරතන හිමි ද විදේශගතව සිටියේය. ඒ කාලයේදී අධ්‍යයනාංශයේ වැඩි කාර්ය භාරයක් රෝහණධීර වෙත පැවරී තිබුණි. සතියකට පැය 25/30 දේශන හා නිබන්ධන සඳහා කාලය යෙදවීමට කොතරම් කාර්යබහුල වුවද කිසිදු අධ්‍යයන නිවාඩුවක් නොගෙන සිදුවූ අකාරය අදත් පවසන්නේ ආධුනික ආචාර්යවරුන් දෙස නෙතගින් බලමිනි. තම පශ්චාත් උපාධි පර්යේෂණ නොකඩවා ඉදිරියට ගෙන ගිය හෙතෙම. 1965 දී විද්‍යෝදය විශ්වවිද්‍යාලයෙන්ම ශාස්ත්‍රපති උපාධිය ලබා ගැනීමට සමත් විය. එම පර්යේෂණ මාතෘකාව වූයේ 'කීර්ති ශ්‍රී නිශ්ශංක මල්ල ය'.

ඒ සමඟම දෙවන ශ්‍රේණියේ කථිකාචාර්ය තනතුරටද උසස්වීමක් ලැබුණ අතර 1972 දී එවකට පැවති රජය විසින් උසස් අධ්‍යාපනය හා විශ්වවිද්‍යාල අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා මහාචාර්ය ඔස්මන්ඩ් ජයරත්නගේ සභාපතිත්වයෙන් පත් කළ ත්‍රි පුද්ගල කමිටුවේ රෝහණදීර මහතා ද සමාජිකයෙක් විය.

මෙම කමිටුව විසින් විශ්වවිද්‍යාල අධ්‍යාපනය විධිමත් කිරීම සඳහා විශ්වවිද්‍යාල ව්‍යුහය, අධ්‍යාපන අංශ, විධිමත් කිරීම, තනි විශ්වවිද්‍යාල සංකල්පය යන කරුණු පිළිබඳව තම නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදි. 'ලංකා විශ්වවිද්‍යාලය එහි ආරම්භකයන් තනාදෙන ලද අච්චුවේම රැදෙන්නට කැමති අතර අවුරුදු ගණනාවක්ම යනතුරු අර්ථවත් මෙන්ම සීරුවෙන් සලකා බලන ආකාරයේ වෙනස්කම් කොට නැත. පැරණි විශ්වවිද්‍යාලයේ ආලින්දය හරහා පවා නැවුම් සුළං රැළි හමායන්නට පටන් ගත්තේ මේ අළුත් විශ්වවිද්‍යාල ආරම්භයේන් පසුවය' යනුවෙන් එක් විද්වතකු කමිටුව හමුවේ ප්‍රකාශය උපුටා දැක්වූ රෝහණදීර විශේෂයෙන් අළුතින් බිහිව වැඩෙමින් පැවැති විද්‍යෝදය විද්‍යාලංකාර විශ්වවිද්‍යාලවල ඇතැම් ශාස්ත්‍ර පථ පිළිබඳව පැන නැගී තිබූ නව ප්‍රවණතා අවධාරණයට ලක්කොට ඔවුන් අනන්‍යතාවය රැකගැනීමට ක්‍රියා කලයුතු බවද ඔහු සවිස්තරව අවධාරණය කෙළේය. කමිටුව වෙත දැන්වූ කරුණ සැලකිල්ලට ගත් රෝහණදීර මහතා තම අදහස් පෙන්වා දීමට අතුරු වාර්තාවක් ඉදිරිපත් කරමින් විශ්වවිද්‍යාල වෙනස්කම් පිළිබඳව පැහැදිළි කළේය. තනි විශ්වවිද්‍යාල ජාතික අවශ්‍යතාවන්ට අනුකූල නොවීම, නවීකරණයට හා දේශියත්වයට හැඩ නොගැසීම, ශාස්ත්‍රීය දියුණුවට බාධා පැමිණීම ආදිය පිළිබඳ අදහස් දැක්විය. මහාචාර්ය රෝහණදීරයන්ගේ අදහස් බොහෝදුරට නිවැරැදි බව 1972 තනි විශ්වවිද්‍යාලයක් ඇති කොට ක්‍රියාත්මක වූ කාලය තිස්සේම පැහැදිළි විය. විද්‍යොදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලවල අධ්‍යයනාංශ කප්පාදු වීම, කිරීම හේතුවෙන් හා ඉදිරි සාර්ථක ගමනට බාධා ඇති විය. දේශිය අධ්‍යාපනයට හා සංස්කෘතියට දායාද වශයෙන් පැවැති පාලි, සංස්කෘත, බුද්ධ ධර්මය වැනි අධ්‍යාපන අංශ ඉතාමත් සාර්ථක ලෙස පවත්වාගත් විද්‍යොදය විශ්වවිද්‍යාලයට ඒවා අහිමි විය. දේශිය වෛද්‍ය අධ්‍යයනාංශය මුළුමනින්ම වැසී ගියේය. විශ්ව විද්‍යාලවලටත් ආචාර්‍ය මණ්ඩලටයත් ඉතා ප්‍රයෝජනවත් වූ මුද්‍රණලය අහිමි විය. විද්‍යෝද විශ්වවිද්‍යාලයේ ආදී කතෘ ගෞරවාර්හ වැලිවිටියේ සෝරත නාහිමියන්ගේ පෞද්ගලික උනන්දුවෙන් දියුණු කර තිබූ පුරාවිද්‍යා අධ්‍යයනාංශය විශ්වවිද්‍යාලයට අහිමි විය. එම අධ්‍යයනාංශවල බුද්ධිමත් ආචාර්ය මණ්ඩලය වෙනත් විශ්ව විද්‍යාලයවලට මාරු කරන ලදහ. පසු කලක නැවත මේ අධ්‍යයනාංශවලින් සමහරක් පිහිටුවනු ලැබුවද ඒවා ඊටපෙර පැවැති උසස් තත්ත්වයට ගෙන ඒමට තවමත් අසිරුවී තිබේ.

1974 වර්ෂයේ ජපන් පදනමේ අධිශිෂ්‍යත්වයක් දිනාගත් ආචාර්ය රෝහණධීර තෝකියෝ කියෝතෝ ශිෂුධකයන් විශ්වවිද්‍යාලවලට අනුයුක්තව පූරා වර්ෂයක් තුළ ජපානයේ බුදු සමයේ ඉතිහාසය පිළිබඳව පරියේෂණ කළේය. 1978 දී කුසලතා මත ඉතිහාස අධ්‍යයනාංශයේ සහාය මහාචාර්ය ධූරයට පත්විය. මහාචාර්ය හේම එල්ලාවල විශ්‍රාම යාම නිසා පුරප්පාඩු වූ ඉතිහාස පිළිබඳ මහාචාර්ය ධූරය පිරවීම විශ්වවිද්‍යාලය බලධාරින් විසින් පියවර නොගැනිමේ හේතුවෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් අහෝසි කරන ලදි. එම පදවිය යලිත් ඇති කරන ලද්දේ 1989 වසරේදීය. මහාචාර්ය ධූරය අහෝසි කරවිමේ හේතුවෙන් ඒ වන විට සහය මහාචාර්ය ධූරයේ වසර 10 කටත් වඩා කාලයක් රැඳි සිටි 1989 පැවැති විවෘත තරගයෙන් තේරී මහාචාර්ය ධූරයට පත්විය. 1994 මැද භාගයේ උතුරු මැද පළාත් අනුබද්ධ විශ්වවිද්‍යාලයේ අධ්‍යක්ෂ ලෙස විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම විසින් පත්කරන ලද මහාචාර්ය රෝහණධීර අනුබද්ධ විශ්ව විද්‍යාල ජාතික විශ්ව විද්‍යාල බවට පත් කළ යුතු යැයි දියත් කර තිබූ ව්‍යාපාරයට ඉමහත් සහයක් දැක්විය. 1995 දී ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධූරයට පත් වී විශ්‍රාම යන තෙක් එම ධූරය හෙබවිය.

මහාචාර්ය රෝහණධීර අධ්‍යයන හා ශාස්ත්‍රීය කටයුතු කෙරෙහි පමණක්නොව දේශපාලන කටයුතු කෙරෙහි ද උනන්දු වක් දැක්වූ කෙනෙකි. නිට්ටඹුව ගුරු අභ්‍යාස විද්‍යාලයේ සිටි අවධියේ ප්‍රථම වරට මුණ ගැසුණ වේලේ සිට ඔහු හද තුළ දෝංකාර දෙමින් පැවැති දිවංගත එස්. ඩබ්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා ගැඹුරු කටහඬ මහාචාර්ය රෝහණධීරගේ ශ්‍රී ලංකා නිදහස පක්ෂ නැඹුරුව පිටුපස රාව නැගෙන තරුණ නාදය සේ ඔහු සළකයි. ඒ නිසාම 1953, 1956 1960, 1965, 1970, වර්ෂවල මහාමැතිවරණවලදී හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජයග්‍රහණය කරවනු සඳහා ඔහු දැඩි කැපවිමක් ක්‍රියා කාරි විය. 1977 මැතිවරණයෙන් පරාජය වූ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නැවත නඟා සිටිවනු සඳහා පත් කරන ලද කමිටුවේ ලේකම් වශයෙන් තම ශ්‍රමය හා කාලය මිඩංගු කොට එම කමිටුවේ නිර්දේශ මත 1978 වර්ෂයේදී පක්ෂයේ නව ව්‍යවස්ථාව පිළියල කොට එය සමස්ත ලංකා කාරක සභාවට ඉදිරිපත් කොට පැහැදිළි කිරීමේ කාර්ය භාරවූයේ රෝහණධීර මහතාට ය. අනුර බණ්ඩාරනායක මහතා සමග දිවයින පුරා ගම් දනව්වල සැරිසරමින් තරුණ සමිති සාමාජිකයින් හමුවෙමින් ඡන්ද කොට්ඨාශ නියෝජිතයින්, දිස්ත්‍රික් නියෝජිතයින් මුණගැසෙමින් එම නව ව්‍යවස්ථාව හඳුන්වා දෙනු සඳහා දින සති මාසගණන් තම ශ්‍රමය හා කාලය වැය කෙළෙ දැඩි කැප වීමකිනි. එම ව්‍යවස්ථාව ක්‍රියාත්මක කිරීම සඳහා පත්කළ භාරකාර දේශපාලන මණ්ඩලයේද සාමාජිකයකු වූ හෙතෙම 1980 වසරේ තිස්සමහාරාම මැතිවරණ කොට්ඨාශයේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂ සංවිධානයක ලෙස පත් කරනු ලැබීය. 1984 සිට අවිස්සාවෙල්ල ආසනයේ සම සංවිධානයක ලෙසපත්ව ක්‍රියා කාරි දේශපාලන කටයුතුවල නියුක්තව සිටි මහාචාර්ය

රෝහණදීරට 1989 මහා මැතිවරණයේදී කොළඹ දිස්ත්‍රික්කයේ අපේක්ෂකයකු ලෙස තරඟ බිමට පිවිසීමට නාමයෝජනා ලැබිණි. නමුත් නාමයෝජනා භාර ගන්නා දිනට පෙර දින හැන්දෑවේ පක්ෂ නායිකා බණ්ඩාරනායක මැතිණියට ලිපියක් මගින් තමා තරඟ නොකරන බැව් දන්වා ඒ වන විටද බිහිසුනු වෙමින් පැවැති ක්‍රියා කාරී දේශපාලන පොර පිටියෙන් ඉවත් විය. භීෂණ සමයේ 1989 දෙසැම්බර 27 වනදා තම වැඩිමහල් පුත් වරුණ රෝහණදීර ගේ අතුරුදහන් වීමෙන් ඇතිවූ දැඩි අධ්‍යාත්මක කම්පනයෙන් පසු වර්ධනය වෙමින් පවත්නා ආත්මාර්ථකාමී කුරිරු දේශපාලන සංස්කෘතිය කෙරෙහි ඔහු දැඩි කළකිරීමකට පත්ව සිතයි.

1970 වසරේ පළවූ හොඳම ඉතිහාස ග්‍රන්ථයට පිරිනැමෙන තිළිණය 1971 වසරේ සාහිත්‍ය උත්සවයේදී අග්‍රාණ්ඩුකාර විලියම් ගොපල්ලව ලංකේශ්වරයාණන් අතින් මහාචාර්ය රෝහණදීරගේ අසගිරියෙ තල්පතින් අලුත්වන ලංකා ඉතිහාසය නැමැති ග්‍රන්ථයට හිමි විය.

ශ්‍රී ලංකාද්වීපයේ ජාතික ප්‍රතිපත්ති සාධනයේදී ඉතිහාස ක්ෂේත්‍රයෙ ව්‍යාපෘතීන් සඳහා වූ සේවයට පිරිනැමෙන ප්‍රසාදාත්මක තිළිණය අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු පිළිබඳ ඇමති ගරු වි.ජ.මු.ලොකුබණ්ඩාර මැතිතුමාගේ නිර්දේශය පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ශ්‍රීමත් රණසිංහ ප්‍රේමදාස මැතිතුමා අතින් 1989 ඔක්තෝම්බර් මස 13 දින කොළඹ සරසවිපායේ පැවැති ආචාර්ය සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මැතිතුමාගේ එකසිය පස්වැනි ජන්ම දින සමරු උත්සවයේදී මහාචාර්ය රෝහණදීර මහතාට පිරිනැමිණ.

1961 සිට ගතවූ තිස්පස් වසරක කාලය තුළ සහකාර කථිකාචාර්ය ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහාය මහාචාර්ය හා ජ්‍යෙෂ්ඨ මහාචාර්ය යනුවෙන් අනු පිළිවෙලින් උසස් වීම් ලබමින් විශ්වවිද්‍යාලයේ ඉතිහාස අධ්‍යයනාංශයේ අංශාධිපති ධුරය පසුව ඉතිහාසය හා පුරාවිද්‍යා අධ්‍යයනාංශය බවට පත්වූ විට එහි අංශාධිපති ධුරය, විශ්වවිද්‍යාලයේ විනය පාලක තනතුර හා සනාතන සභාවෙන් පත් කරන ලද විවිධ කොමිටිවල සභිසික තනතුරු හා රජරට අනුබද්ධ විශ්ව විද්‍යාලයේ අධ්‍යක්ෂ තනතුරු ආදී තනතුරු දරමින් විශ්ව විද්‍යාලයේ ශාස්ත්‍රීය කටයුතු පමණක් නොව ශුභසාධන හා පරිපාලන කටයුතුවලට ද සහාය විය.

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පමණක් නොව කොළඹ විශ්වවිද්‍යාලය, කැළණිය විශ්ව විද්‍යාලය වලද දකුණු ඉන්දියාවේ මදුරෙයි කාම්රාජ් විශ්වවිද්‍යාලය, තමිල්නාඩු මදුරායි විශ්වවිද්‍යාලය හා දකුණු අප්‍රිකාවේ නයිජීරියාවේ විශ්වවිද්‍යාලය යන විදේශීය විශ්වවිද්‍යාලවලත් පශ්චාත් උපාධි පර්යේෂණ ඇගැයීමේ පරීක්ෂක මහාචාර්යවරයෙකු ලෙසද කටයුතු කරයි.

අධ්‍යාපන අමාත්‍යංශයේ විෂය නිර්දේශ පිළිබඳව සකස් කෙරෙන ග්‍රන්ථ පිළියෙල කිරීමේ සංස්කාරක මණ්ඩලයේද, පුරාවිද්‍යා උපදේශක මණ්ඩලයේද යුනෙස්කෝ සංස්කෘතික ත්‍රිකෝණයේ අභයගිරිය ව්‍යාපෘතියේ

විශේෂ උපදේශකකයකු වශයෙන් ද පුරාවිද්‍යා පශ්චාත් උපාධි අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු ලෙසද ශ්‍රී ලංකා ඉතිහාස සංගමයේ සභාපති ධුරය හා විධායක මණ්ඩලයේ තිලතල දැරීමෙන් ද යුනෙස්කෝ ජාතික කොමිසමේ සාමාජිකයකු ලෙසත් සංස්කෘතික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ නූතන සාහිත්‍ය පිළිබඳව පත් කළ උපකමිටු සාමාජිකයකු වශයෙන් ද පුස්තකාල මණ්ඩලයේ ග්‍රන්ථ සමීක්ෂණ මණ්ඩලයේ නිරීක්ෂකවරයකු වශයෙන්ද ජාතික සංවර්ධනය උදෙසා ද කැපවී සිටී.

මෙම කාල පරිච්ඡේදය තුළ විදේශීය රටවල් ගණනාවක පැවැති‍ණු ශාස්ත්‍රීය සම්මේලන, සම්මන්ත්‍රණ රාශියකම සහභාගිවීමට මහාචාර්ය රෝහණධීර මහතාට ආරාධනා ලැබිණි. 1972 සෝවියට් රුසියාවෙන්ද 1979 යුගොස්ලෝවියාවෙන්ද ඇරයුම් ලබා සංචාරයේ යෙදුනු අතර එම රටවලදී ශාස්ත්‍රීය සම්මන්ත්‍රණ සම්මන්ත්‍රණ රාශියකටම සහභාගිවී විය. 1985 තායිලන්තයේ බැංකොක් නුවර රාම්කම්හෙන්ජ් විශ්වවිද්‍යාලයේ ආරාධනාවක් අනුව ගොස් "ලංකා හා දකුණු ඉන්දියාව අතර සම්බන්ධතා" යන මැයෙන් දේශනයක් පැවැත්වීය. 1986 බැංකොක් නුවර සියම් සමාජයේ මෙහෙයවීමෙන් "ලංකාව හා තායිලන්තය අතර බෞද්ධ ආගමික සම්බන්ධථාවල ගැටළු" යන මාතෘකාව යටතේ සම්මන්ත්‍රණ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය. 1987 බැංකොක් නුවර මහාචූලාලන් කොරන් විශ්වවිද්‍යාලය ජාත්‍යන්තර සම්මන්ත්‍රණයකට සහභාගි වෙමින් "ලංකාවේ ජනවාර්ගික ප්‍රශ්නයේ ඉතිහාසය" පිළිබඳ ප්‍රසිද්ධ දේශනයක් පැවැත්වීය. 1992 හොංකොංහිදි ඉතිහාසඥයින්ගේ ජාත්‍යන්තර සම්මේලනයේදී "ලංකාව හා තායිලන්තය පිළිබඳව මූලාශ්‍ර අධ්‍යයනය" පිළිබඳව සම්මන්ත්‍රණ පත්‍රිකාවක් ඉදිරිපත් කළ අතර 1994 ඉන්දියාවේ මදුරායි, තන්ජෝර් (Thanjor) කාන්චිපුරම්, තිරු ආදි හා ඓතිහාසික ස්ථානවල පුරාවිද්‍යාත්මක ගවේෂණයක නිරත විය. 1995 වසරේදී බොම්බායේ සොමයියා බෞද්ධ ආයතනයේ ආරාධනයක් ලැබ සිංහල බෞද්ධ සංස්කෘතිය මෞර්ය සංස්කෘතියෙන් පරිණාම වූවකි යන මාතෘකාව යටතේ පර්යේෂණ යන තේමාව යටතේ පත්‍රිකාවක් ඉදිරිපත් කළේය.

1995 අමෙරිකා එක්සත් ජනපදයේ ලොස් ඇන්ජලිස් නගරයේ බෞද්ධ ආයතනයේදී "ලංකාවේ බෞද්ධ සංස්කෘතිය" පිළිබඳ දේශනයක් පැවැත්වීය. මහාචාර්ය රෝහණධීර ඉතා ආදශීමත් පවුල් දිවියක් ගෙවන දරුවන් හතර දෙනෙකුගේ පියෙකි. තම දරුවන්ට නිසි අධ්‍යාපනය ලබා දී ඔවුන්ගේ අනාගතය යහමහට යොමු කරනු සදහා පියකු වශයෙන් නව යුතුකම් සපුරා ඉටු කර ඇත. 1970 දි ලංකා ඉතිහාසයේ සැඟවුණු තොරතුරු රැසක් හෙළි කරන අස්ගිරියේ තල්පත හඳුනා ගැනීම හා තායිලන්තයේ 8 වන සියවසට අයත් සෙල්ලිපියක ශ්‍රී ලංකාවේ තේලකටාහ ගාථා කාව්‍යය ආරම්භක ගාථා තුන කියවා ලෝකයට හඳුන්වා මහාචාර්ය රෝහණධීරයන්ගේ ඉතිහාසයේ නිම්වළලු පුළුල් කිරිමෙහිලා ඉටුවූ සුවිශේෂ දයකත්වය ලෙස මෙ රට හා පිටරට ඉතිහාසඥයන් පිළිගෙන ඇත.

මහාචාර්ය රෝහණධීර මහතා අංග සම්පූර්ණ විශ්වවිද්‍යාලයී මහාචාර්යවරයෙකි. මූලික වශයෙන් සම්ප්‍රදායික අධ්‍යාපනයෙන් පෝෂණය ලත් එතුමා පැරණි පෙරදිග භාෂා හා නූතන භාෂා ඥානයෙන් පෝෂණය වූ විචාර බුද්ධියකින් යුත් ඉතිහාසඥයෙක් ද විය. ඒ නිසාම ඉතා හොඳ

ආචාර්යවරයෙකු ද විය. ශිෂ්‍යයන් ආදරය කළ පියෙකු බඳු විය. එවැනි උත්තමයකුට මෙම විද්‍යෝදය ශාස්ත්‍රීය සංග්‍රහය උපහාරයක් වන්නේමය. විශ්වවිද්‍යාලයෙන් විශ්‍රාම ලැබුවත් තම සේවය විශ්වවිද්‍යාලයට සලසන මහාචාර්ය රෝහණදීර මහතාට දීර්ඝායු ප්‍රාර්ථනා කරමි.